
# අපට වටින අලි

# සම්පත



# අපට වටින අලි සම්පත

මුතුලි නතාරා දසනායක

වෙනත් කෘති
හා පැංචාගේ වීර චාරිකාව

මහාමායා බාලිකා විදුහල
8 ශ්‍රේණිය B

2026/05/10

978624208940-9

# පිදුම

මගේ ආදර අම්මාට

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

අලියා ගොඩබිම සිටින විශාලම කිරි බී වැඩෙන සතෙකි. මනුෂ්‍ය ඉතිහාසය පුරා අලි භයංකර බවට මෙන්ම අගය කිරීමට ලක්ව ද ඇත. ඔවුන් රටක සමෘද්දිය පෙන්වන සංකේතයක් ද වේ. අලියා ශ්‍රී ලංකාව හැදින්වීමේ ලාංඡනයක් බවට පත් වී ඇත. මේ නිසා අලියා අපේ ජාතික උරුමයේ වැදගත් කොටසක් එමෙන්ම අප රටේ ආර්ථිකයටද අත්‍යවශ්‍ය කොටසක් එයට හේතුව අලින් නැරඹීමට විදේශ සංචාරකයින්ගේ පැමිනීමයි.

මෙම පර්යේෂණ ග්‍රන්ථයේ ප්‍රධාන අරමුණු කිහිපයකි. ඒවා නම් අලි ගහනය ගැන තොරතුරු දැන ගැනීමයි

* ඔවුන්ගේ බාහිර පෙනුම හා පැතිරීම
* අතීතයේ අලි මිනිස් සහජීවනය
* අලි ගහනයේ හැසිරීම් රටා හා චර්යා රටා
* අලි ඇතුන් හීලෑ කිරීම හා පුහුණු කිරීම.
* වනයේ සරන අලි
* වෙනස් වන පරිසරයට දක්වන ප්‍රතිචාර

* අලි මිනිස් ගැටුම් හා විසදුම්
* අපට වටින අලි සම්පත

ඔවුන්ගේ බාහිර ස්වරූපය හා පැතිරීම

අප්‍රිකාව තුල මීට අවුරුදු මිලියන 55 ට කලින් අලින්ගේ මුතුන්මිත්තන් ජීවත් විය මුලින් ජීවත් වු අලින් වර්ග 2 වන්නේ ඇමරිකන් මැස්ටඩන් (Mammoth americium) හා වුලී මැමත් (Mammoths) යන වර්ග දෙකයි අද ජීවත් වන ආසියානු අලියා වන (Elephas maximus) එලිෆාස් මැක්සිමස් පැවත එන්නේ ඔවුන්ගෙනි ආදි කාලයේ අලි වර්ග හිමයුගය හා දඩයම් කිරීම නිසා නැති වී ගිය බව පෙනේ

අද කාලයේ ජීවත් වන්නේ ආසියානු අලියා වන එලිෆාස් මැක්සිමස් (Elephas maximus) හා අප්‍රිකානු අලියා වන ලොක්සො ඩොන්ටා ඇෆ්‍රිකානා (Loxodonta africana) යන වර්ග දෙකයි. අප්‍රිකානු අලියා ඓතිහාසික යුගයේ අප්‍රිකාවෙන් පිටත වාසස්ථාන හදා ගත්තේ නැත. නමුත් ආසියානු අලියා යුරේෂියාව දක්වා පැතිර සිටි බවට කියයි.

අප්‍රිකානු අලියාගේ වෙනස් හැඩයක් ඇත. ඔවුන්ගේ පිටුපස උත්තල හැඩයක් ඇත. උරහිස් කඩා වැටුනු පිටුපසින් උස්වූ පෙනුම ඔවුන්ට ඇත. අනික් අතට ආසියානු අලියා හැඩය අවතල හා ගෝලාකර හැඩයක් ඇත. අප්‍රිකානු අලියාගේ කන් විශාලයි. ඒවා රවුම් හැඩයක් ගනී. ආසියාවේ අලියාගේ කන හිසට පහලින් ත්‍රිකෝණාකාර හැඩයට ඇත. මේ අලි දෙවර්ගයේ හිසේද වෙනස්කම් ඇත. ආසියානු අලියාගේ හිස දෙකට බෙදි උස්ව පවතී අප්‍රිකානු අලියා හිස පැතලි වේ. එය දෙකට බෙදීද නැත. එමෙන්ම ඇෆ්‍රිකානා අලියාගේ සිරුරේ උසටම වැඩී ඇත්තේ උරහිස් ප්‍රදේශයයි.


අප්‍රිකානු අලියාගේ ගැහැණු හා පිරිමි දෙපිරිසටම දල පිහිටයි ඒවා දිගින් වැඩි තද දළ වර්ග වේ. එමෙන්ම ආසියානු අලියාගේ සමහර අලින්ට දල ඇති අතර දල ඇති පිරිමි අලි 10% පමණ ඇත. ඉන්දියාවේ මේ ප්‍රමාණය 90% කි. එනම් ඔවුන් ඇත්දල ඇති පිරිමි අලින් වේ.


අප්‍රිකානු ඇතාගේ දල බරින් වැඩියි ඒවා 70 Kg වන අතර ආසියානු අලියාගේ එය 30 Kg පමණ වේ.

ආසියානු අලියාගේ ඉදිරිපස කකුල් වල නියපොතු පහක්ද පිටුපස කකුල් වල නියපොතු හතරක්ද ඇත.

අප්‍රිකානු අලියාගේ ඉදිරිපස කකුල් වල නියපොතු හතරක් හා පසු පස කකුලේ නියපොතු 3ක් ඇත.

| අප්‍රිකානු අලියා | ආසියානු අලියා |
|---|---|
| අප්‍රිකානු මහද්වීපය තුල ජීවත් වේ ලොකු රවුම් කන් ඇත හිසට උඩින් කන් පැතිර යයි. අවතලපිටුපස (Concave) ගැහැණුපිරිමිදෙපාර්ශව යටම දල ඇත<br>බර 70 Kg | බංගලාදේශය,භූතානය,කැම්බෝජියාව, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ලාඕස්, මැලේෂියා,මියන්මාර්,නේපාලය,ශ්‍රීලංකා ව,තායිලන්තය හා වියට්නාමයේ ජීවත් වේ. ත්‍රිකෝණාකාර කන් ඇත කන් හිසට පහලින් පිහිටයි උත්තල පිටුපස (Convex), 5% පිරිමි අලින්ට දළ ඇත<br>බර 50 Kg |



අතීතයේ සිට අලි මිනිස් සහජීවනය

ඈත අතීතයේ පටන් අලින්ගෙන් වැඩගත් බවට සාධක ඇත. යුද්ධ සදහාද ඔවුන් යොදා ගත්තේය. රෝම සේනාවට විරුද්ධව අලින් යොදාගෙන හැනිබාල් නැමැති සටන් කාමියා යුද්ධ කල බව පොත්පත් වල සඳහන් වේ එකල අලින් අප්‍රිකානු යක්ෂයින් ලෙස හඳුන්වා ඇත.

තුන්වන සියවසේ අලි රංගපීඨ වල සර්කස් සඳහා යොදාගෙන තිබුනි. මිනිසුන් සමඟ එකට අලින්ට වැඩකල හැකිය. මේ හැකියාව නිසා ඔවුන් පුහුණු කල හැකි ඥවනක් සහිත සතුන් බව හෙලිවිය. සිංහයන් හා වලස්සුන්ට වඩා උපක්‍රම භාවිතා කරගෙන දක්ෂ ලෙස සර්කස් කණ්ඩායම් වල රඟ දැක්වීමට අලින්ට පුළුවන් වුනා.

සමෘද්ධිය හා ආරක්ෂාව සමඟ සම්බන්ධවන මිනිසුන්ගේ වැඩ සදහාද අලින් යොදා ගන්නා ලදී. පුරාණ කාලයේ හීලෑ අලි මිනිසුන් සමග හොද සම්බන්දයක් ඇති කරගෙන වැඩ කටයුතු කලා නමුත් අලින්ව විවිධ හිරි හැර වලට ලක් වුනා. යුධ අභ්‍යාස සදහා යොදාගත් අලි මරණයට පත් වුනු අවස්ථා

තිබුනා. හෙල්ලෙන් ඇනීමෙන් වධ හිංසා වලට ලක් වීමෙන් ඔවුන් මරණයට පත් වුනා.

18 වන සියවසේ යුරෝපයේ සත්ව විද්‍යාඥයින් ඔවුන්ව අගය කලා ඔවුන් ගැන උනන්දු වුනා. අලින් වඳුරන්ට, බල්ලන්ට වඩා විශේෂ වුනා. ඔවුන්ගේ හොඬවැල මගින් කරන කාර්යද විශේෂ වුනා.


## අලින්ගේ හැසිරීම හා චර්යා රටා

අලින් ශාක භක්ෂක සතුන්වේ. ඔවුන් ශාක ආහාර විශාල ප්‍රමාණයක් ආහාරයට ගනී. තණකොළ වර්ග , පඳුරු, වැල්, විශාල කොළ තියන ශාක, පොල් වැනි තාල වර්ගයේ ගස් ඔවුන් ආහාරයට ගනී. ඔවුන් කොළ,රිකිලි,දළු,මල්,ගෙඩි ආදිය ලෙස ශාකයෙන් 60% - 70% ප්‍රමාණයක් කෑමට ගනී.

අලින් ආහාරයට ගන්නා දේවල් ඒවා වල තිබෙන ප්‍රමාණය අනුව වෙනස් වේ. තමා ජීවත් වන ප්‍රදේශයේ ඇති දේ ඔවුන් ආහාරයට ගනී. ඉන්පසු සෘතු අනුව වෙනත් පලාතකට යෑමේ දී එහි අති දේට පුරුදු වේ. පළතුරු ඔවුන් නිතර කෑමට ගන්නේ නැත්තේ ඒවා හැම විටම ඔවුන්ට ලැබෙන්නේ නැති නිසාය.

ඔවුන් කෑම ගන්නා මට්ටම් 3 ක් ඇත. ගස්වල ඉහලින් ඇති අතු ඉන් 1 කි පඳුරු හා කුඩා ශාක මෙහි දෙවෙනි මට්ටමයි තණකොල වැනි ශාක අනික් ආහාර මට්ටමයි තණකොළ වර්ග වැඩියෙන්ම ආහාරයට ගන්නා මට්ටමයි.

ආහාර විශාල ප්‍රමාණයෙන් පරිභෝජනයට ගන්නා ඔවුන් තමන්ට අවශ්‍ය ප්‍රමාණයට වඩා අතු කඩා දමයි. මේ ආකාරයෙන් ගස් අතු කඩා දමා තම හොඩය මට්ටමේ ඇති වැඩි ප්‍රමාණයක් අතු කඩා දැමීමට ඔවුන් කැමැත්තක් දක්වයි.



අලින් රෑට කෑම හොයාගෙන යන සතුන් වේ උදේ 10.00 පමණ වනතෙක් කෑම ගන්නා ඔවුන් හවස 4 පමණ වනතෙක් විවේක ගනී. ඔවුන් බොහොම වීවේකීව ආහාර ගන්නා සතුන් වේ. පිරිමි අලි

ඉක්මනට ගමන් කරන අතර ආහාර ද ගනී, පැටවුන් හා ගැහැණු සතුන් ද ප්‍රමාද වී පැමිණේ

අලින් පොල් ගෙඩි කකුලින් පොඩිකර පොත්ත තලා ගලවා මදය ආහාරයට ගනී එමෙන්ම දිවුල් ගෙඩියද ඒ ආකාරයට පොඩි කර කෑමට ගනියි.

කෙසේ නමුත් මිනිසුන් ජීවත්වන ප්‍රදේශ වලට ලඟින් ජීවත් වන අලින්ගේ ආහාර ගන්නා ක්‍රමයේ වෙනසක් දක්නට ලැබේ. එවිට ඔවුන් මිනිසුන් පරිභෝජනයට ගන්නා ආහාර වලට කැමැත්තක් දක්වයි. මෙසේ වී පොතු බැහැර කරන ප්‍රදේශ වල ඒවා කෑමට අලින් කැමැත්තක් දක්වයි. එමෙන්ම ඔවුන් ප්‍රීමා කර්මාන්ත ශාලාවෙන් ඉවත ලන පිටි කෑමටද පුරුදු වී සිටින බව කියවේ. තවද ඔවුන් විදේශ සංචාරකයින් සිටින හෝටල් ආදී ප්‍රදේශ වලට ආහාර සොයා යෑමට පුරුදු වී සිටී.

අප්‍රිකානු අලියා අල වර්ග (yams) හාරා කෑමට කැමැත්තක් දක්වයි. නමුත් ලංකාවේ අලින් අතර මෙම පුරුද්ද නැත. අලින් මිනිසුන්ගේ වගා බිම් වලට යන්නේ ද කෑම සෙවීමටයි. මෙහිදී කෙසෙල්, පැපොල් වැනි පළතුරුද, කුරක්කන්, බඩ ඉරිඟු, වී වැනි ධාන්‍ය

ද වැඩිපුර ආහාරයට ගනී, ඊට අමතරව උක් ගස් කෑමට ද ඔවුන් කැමති බව සදහන්ය.

අලින් ජලයේ බැස සිට තම ශරීරයේ උෂ්ණුසුම අඩුකර ගැනීමට කැමතිය. වන උද්‍යාන හා කැලෑ වල අලින් රංචු පිටින් වතුරේ බැස සිටින ආකාරය අපට දැක ගැනීමට පුළුවන් වේ.

අලින් නොයෙක් ශබ්ද නිකුත් කරයි. තම හොඩ වැල භාවිතා කර හා කටින් ද ශබ්ද පිට කිරීමට අලියාට හැකියාව ඇත. තරහ පෙන්වීමට අලියා හොඩවැලෙන් ශබ්ද පිට කරයි.(Charge)අලි කෑම කන විට කරන ශබ්ද මීට වෙනස් වේ. ඔවුන් තුවාල විමකදී නගන ගොරවන ශබ්දය මීට වෙනස්වේ. එය උගුරෙන් හට ගනී. කැලේ ඈත සිටින තම රංචුවට කරන සංඥද්ඥා ද මේ අතර වේ. ඒවා 4km පමණ දුර යන බව පැවසේ. එම ශබ්ද වනාන්තරය පුරා පැතිර යයි.

අලින් හොද බුද්ධියක් ඇති සතුන් කණ්ඩායමකි. ඔවුන් ඉක්මනින් ඉගෙන ගනී ඔවුන්ට හොද මතක ශක්තියක්ද ඇත. ඔවුන් අණට කීකරු වේ. ඒවා පිලිපදියි. මේ නිසා අලියා යනු අනිත් සතුන්ගෙන්

සෑහෙන පමණ වෙනස් වූ සිතීමේ ශක්තිය ඇති සතෙකි. අලියා යන්ත්‍රයක් මෙන් වැඩ නොකරයි. තමාට පවරන වැඩ සිතාබලා කරයි. වෙනස් වීම් වලට හැඩගැසීමේ හැකියාව අලියාට ඇත. මෙයට හේතුව මේසතාගේ සිතීමේ හැකියාවයි.

## හොඳින් වැඩුණු අලියෙකුගේ ලක්ෂණ.

| ශරීරාංග | ලක්ෂණ |
|---|---|
| හිස | විශාල, හොඳින් පිරුණු කම්මුල් සහ රවුම් නළලකින් යුක්ත වීම නීරෝගී ලක්ෂණයකි. |
| ඇස් | දීප්තිමත්, පැහැදිලි සහ බැඳුණු පටලවලින් රහිත වීම සහ ජලීය බව අඩුවිය යුතුය.<br>ඇස් විශාලවීම යහපත්ය. |
| හොඬය | හොඬය දිග, පළල්සහ අත්‍යාවශ්‍යය ප්‍රමාණයට ඝන විය යුතුය. |
| කන් | විශාල, පළුදු නොවූ, අධිකව එල්ලා වැටෙන කන් වලට වඩා කොට පුළුල් හා ගැඹුරු කන් යහපත්ය. |

| | |
|---|---|
| පපුව | පුළුල්, ලිහිල් සම හා ඝන බෙදීම් වලින් යුක්ත හම නීරෝගීය. |
| ඉදිරි පාද | කොට මාංශපේශි සහිත පාද නීරෝගීය. |
| පිටු පස | පුළුල්,කවාකාර පසුපසකින් යුක්තය |
| කොන්ද | කැලැල් රහිත සමෙන් වැසුණු කොඳු නාරටියකින් යුක්තය. |
| ශරීරය | බැරල් ආකාර, වඩා කොට නොවු ශරීරය. |
| පසුපසපාද | හොඳින් මසින් වැසී තිබිය යුතුය. කොට සවිමත් පාද යහපත්ය. |
| පතුල් | ගොරෝසු පතුල් හා පිරිසුදු නිය තිබිය යුතුය. |
| වලිගය/සම | දිගු බූසි වලිගය සහ තෙතමය සහිත ඝන සම. |

**හීලෑ කරන ලද අලි.**

අවුරුදු ගණනක සිට මිනිසා අලියාගෙන් ප්‍රයෝජන ගෙන ඇත. සෑම අලියෙක්ම කැලයෙන් අල්ලා ගත් එකෙක් වේ. නුවර සිටි රජ ඉන්දියාවෙන් හා මියන්මාරයෙන් ඇතුන් ගෙන්වා ගෙන ඇත. ඒ ඇතුන් වැඩි කර ගැනීම සඳහා කරන ලද දෙයකි.

අවුරුදු 3000ට කලින් සිට අලින් අල්ලා ගැනීම, හා පුහුණු කිරීම කරගෙන යන ලදී. නමුත් ඔවුන්

බල්ලන් මෙන් ගෙවල් වල ඇති කළේ නැත. ඒ ඔවුන්ගේ ශක්තිය හා භයංකර බව නිසාය කෙසේ හෝ ඇත් ගොව්වන් මගින් ඔවුන් වචන කිපයකට පුරුදු කර ගැනීම කර ඇත. එ මගින් මේ විශාල ශක්ති වන්ත සතා මෙල්ල කරගෙන ඇත. ඇත් ගොව්වාත් අලියාත් අතර හොඳ
බැදිමක් පවතී. ඔවුන් එකතු වී හොදින් වැඩ කරයි.



කෙසේ නමුත් අප්‍රිකානු අලියාට වඩා ඉක්මනින් ආසියානු අලියා හීලෑ කර ගත හැකි බවට මතයකි. විශේෂයෙන් ලංකාවේ අලි වැඩ ගැනීම සදහාත්, උත්සව සදහාත්, ආගමික අවස්ථා සදහාත් යොදා ගනී. අප්‍රිකානු අලින් මෙසේ යොදාගත් අවස්ථා ඉතා අඩුය.

මෙසේ වලවල් කැපීම හා මත් බෙහෙත් මගින් ද, හීලෑ අලි යෙදවීමෙන් ද වන අලි හීලෑ කිරීමට හැකිය.

දැනට ලංකාවේ හීලෑ අලින් ගමන් කරන විශාලම උත්සවය වන්නේ නුවර පෙරහැරයි. මෙය ජූලි /අගෝස්තු මාසවල නුවර නගරයේ පැවැත්වේ. මෙහිදී බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතුව කරඬුව පිට තබා ගෙන යන්නේ ඇත් රජෙකු විසිනි.

මෙය 1775 කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ සිට පැවත එන නැට්ටුවන්, බෙරකරුවන්' හීලෑ අලින් ආදිය ගමන් කරන පෙරහැරකි. මෙය සති දෙකක් පමණ රාත්‍රී කාල වල නගරයේ වීදිවල සංචාරය කරයි. අවසන් පෙරහැර සඳහා අලි සියයක් පමණ පෙරහැරේ ගමනේ යෙදෙයි.

රජුගේ ඉඩම් වල අඳේට වැඩ කල මිනිස්සු නැටීම බෙර ගැසීම ආදියෙන් පෙරහැරට සම්බන්ධ වන අතර අලි අයිතිකරුවන් තම අලි පෙරහැර සඳහා දීමට සිදුවේ.

ඒ කාලයේ අලියෙකු බලා ගැනීම අමාරු දෙයක් නොවුනේ කෑම ගොඩක් තිබුනු නිසයි.

නමුත් අ දකාලයේ අලියෙකු ගේ අයිතිකාරයෙක් වීම ඉතාම වියදම් යන වැඩකි. මේ නිසා අලින් අති කිරීම බොහෝ දෙනෙක් අත්හැර දමා ඇත.

අලින් වෙනුවට නවීන උපකරණ මගින් වැඩ ගැනීම ආදිය නිසා (ක්රේන්ස්) අලියාගෙන් ගත හැකි වැඩ ප්‍රමාණය ඉතාම ටිකකි. මේ නිසා වියදම් සහිත අලියෙකු නඩත්තු කිරීම මිනිසුන් අතහැර දමා ඇත. මේ නිසා පසුගිය අවුරුදු වල පෙරහැරේ යන අලි ප්‍රමාණය අඩු වී ඇත.

මෙලෙස ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ අලින් දෙදෙනෙකු ලෙස මාළිගාවේ රාජා ඇතා හා කණ්ඩුල නම් කල හැකිය. කණ්ඩුල යනු දුටුගැමුණු රජුගේ මංගල හස්තිරාජයාවේ. චෝල රජු එළාරට විරුද්ධව කල සටන් වලදී කණ්ඩුල හස්ති රාජයා දුටුගැමුණු රජුගේ හමුදාවේ සිට යුද්ධය සඳහා රජුට උපකාර කර ඇත.


මෙලෙස මාළිගාවේ රාජා ඇතා කරඬුව වඩම්වාගෙන යෑමට අවුරුදු ගණනාවක් සේවය කර ඇත. 1988 ඇතා මියයාමෙන් පසුව අදද කෞතුකාගාරයේ ඇතාගේ පිරවු රුව දැකිය හැකිය.

## අලි පුහුණු කිරීම.

අලි පුහුණු කිරීමසදහා ඇත් ගාලක සිටින කැලෑ අලියෙන් තෝරාගෙන එම අලියාට තද කඹයකින් ලඟ ඇති ගසකට බඳිනු ලැබේ. මෙහිදී පසුපස කකුල් ගසට ගැටගසන්නේ අලියාට නොදැනෙන්ට ඉතා පරිස්සමිනි. අසලගසක් නොමැති නම් වෙනත් හීලෑ අලියෙකුට බඳිනු ලැබේ. මෙම කාලය තුල ගැලවීමට දරන උත්සාහය හේතුවෙන් අලියාගේ කකුලට දැඩිසේ තුවාල වේ. මුල් දිනවල දී ප්‍රතිකාර කිරීමද අමාරු වේ.

දෙවන ක්‍රමය වන්නේ සාමාන්‍ය වැඩ කටයුතු වලට යෙදවීමේ දී තවත් හීලෑ අලි දෙදෙනෙකු හා වැඩට යෙදවීමයි. එයද කලින් මෙන් කඹ වලින් ගැටගසාය ගැලවීමට බැරි වු විට අලිය මෙල්ල වී හීලෑ වේ. මේ සදහා ගින්දරද යොදා ගනී. ඉන් පසුව අලියා ආහාර ගැනීමට පටන් ගනී.

පළමුවෙන්ම කඹයක් අල්ලා ගැනීමට හා කිතුල් කොට ඇදීමට පුරුදු කරයි. ඉන්පසුව ඒවා පෙරලීමටත් ඉදිරියට තල්ලු කිරීමටත් පුරුදු කරයි.



සර්කස් වලදී අලියාට හරිලෙස ශරීරය හැසිරීමට හා ශබ්ද හැසිරවීමට උගන්වන අතර කෑම ත්‍යාග ලෙස ලබාදේ. සෑම අලියාම ඇත් ගොව්වාට හීලා වන්නේ නැත. කුඩා අලි පැටව් පුහුණු කිරීම පහසු වන අතර අලියන් පාලනයට හෙන්ඩුව නමැති උපකරණය භාවිතා කරයි.

අලි භාෂාව.

1.දහ - ඉදිරියට යන්න.

2.හිද - නිදාගන්න

3.හත් දෙව්නෙත්තෙන් - අල්ලගෙන ඉදිරියට යන්න.

4.පික් කින් - අත අරින්න

5.බිල - කකුල ඔසවන්න.

6.බිලම පුර - ඉදිරියට නලලින් තල්ලු කරන්න.

7.බිලම නෙත්නෙත් -පසු පසට පාදයෙන් තල්ලු කරන්න.

8.දෙව් - කන්න/ බොන්න.

9.පිම්බු - කුජචනාද කරන්න.

10.ඉඩ - පැත්තකට යන්න.

11.හෝ - නවතින්න.

12.පික්චිත් අලියා හෝ - කරන වැඩ නවත්තන්න.

13.තෙත් තෙත් - පසු පසට යන්න

14.දන - දන ගහන්න.

15.උඳු දෙරි - හොඬවැල ඔසවන්න.

**වනයේ සරන අලි**

වනාන්තර විනාශය අලින්ගේ ප්‍රමාණය අඩු වීමට ප්‍රධානතම හේතුව වී ඇත. අලියාට අවශ්‍ය වනාන්තර භූමි ප්‍රමාණය ඇති විට ඔවුන් එම ප්‍රමාණය හොඳින් පරිහරනය කිරීමට දක්ෂ වේ. නමුත් අලියාගේ භූමි ප්‍රමාණය අඩු වූ විට ඔවුන් ඇති සෑම දෙයක්ම ප්‍රයෝජනයට ගැනීමටත් වැඩිපුර ප්‍රමාණයක් විනාශ කිරීමටත් පෙළඹේ.

උඩරට රාජධානියේ යටත් වීමත් සමග බ්‍රිතාන්‍ය ජාතිකයන් රටේ පාරවල් සෑදීමට, දුම්රිය මාර්ග සෑදීමට හා තේ වැනි වගාවන් සඳහා විශාල කැලෑ ප්‍රමාණයක් එළි කළේය. තේ හා කෝපි වැවීමට භූමි

සංවර්ධනය කිරීමේදී අලින්ට අයත් විශාල වනාන්තර හෙළි වී ඔවුන්ගේ සංචරණ ප්‍රදේශ ඔවුන්ට අහිමි විය.

එමෙන්ම එකල අලි දඩයම් කිරීමද විනෝද ක්‍රීඩාවක් ලෙස පැවතුනි. ඉන්පසුව කාලයේ වියලි කලාපයට ජලය සැපයීමට බැඳි විශාල වේලි නිසාද එයින් යට වු භූමි ප්‍රමාණයද අලින්ගේ ඉඩකඩ තවදුරටත් අඩු කළේය.

එමෙන්ම වියලි කලාපයේ නව ජනපද පිහිටුවාගෙන පදිංචි වු මිනිසුන් නිසා එම භූමිය ද අලින්ට අහිමි විය. මේ නිසා අලි මිනිස් ගැටුමද ආරම්භ විය. මෙය අලින්ට අහිමි වු තම ආහාර මිනිසුන්ගේ වගාවන්ගෙන් ලබා ගැනීමට ඔවුන් පෙලඹීම නිසා ඇති වු දෙයකි. මෙය අලින් වද වී යාමේ තර්ජනයකට මුහුණ දී ඇති අතර දරුණු ලෙස වර්ධනය වීගෙන යන බව මෑත කාලයේ දක්නට ලැබේ. මෑත දී සිදුවු අලි මරණ ප්‍රමාණය මේ බව පෙන්වයි.

අලියා පාරිසරිකව වැදගත් සතෙකි.බාහිර පෙනුම හා ජවය නිසාද අලි ඇතුන් අගය කිරීමට ලක්වේ.

නව අලියා රටක ආර්ථික සංවර්ධනය සඳහා දායක වේ.

බිජ ව්‍යාප්තියට හා පරිසර අලංකාරයට අලි ඇතුන් උපකාරිවේ. ඔවුන් සංරක්ෂණය නොකලොත් ඉක්මනින් වඳවී යෑමට ඉඩ ඇත. ගම් වාසීන් හා ගොවීන්ගේ මේ පිළිබඳ අවබෝධය වැඩි කලොත් මෙම ප්‍රශ්නයට යම් කිසි විසඳුමක් ලැබිය හැකිය.

සතුන් පිළිබඳ දායාව කරුණාව වර්ධනය කරගත යුතුය. තමාගේ ඉඩකඩම් ආරක්ෂා කරගෙන සහජිවනයෙන් ඔවුන් හා වැඩ කිරීමට මිනිසුන් වන අප දක්ෂ විය යුතුයි.

අලියා නිතර පරිසරයේ හැසිරෙන සතෙකි. එයට හේතුව ඔවුන්ට ආහාර හා ජලය විශාල ප්‍රමාණයක් ඕනෑ වීමයි. මේ විශාල සතුන් ජීවත් වන්නේ ඔවුන්ටම වෙන් වු වනයේ සීමාව තුලයි. අලින් භාවිතා කරන අලිමංකඩවල් ඔවුන්ගේ ගමන් ගන්නා මාර්ග ඔවුන් හොඳින් දනී. මේ නිසා අලින්ව වෙන කැලෑ ප්‍රදේශ වලට පන්නා දැමීම කලනොහැක. එසේ කලත් ඔවුන් නැවත සැතපුම් ගණනක් දුර ගෙවා හෝ තමා සිටි ප්‍රදේශයටම පැමිණේ.

එසේ ම අලිවැට ඉදිකිරීමෙන් එය ඔවුන්ගේ ගමන් මග හරිහැටි හඳුනාගෙන කටයුතු කල හැකිය. එය ඉදි නොකලොත් එය සාර්ථක නොවන බව කියයි.

මිනිසුන් විසින් වනාන්තර වල ගම්මාන සාදා ගැනීමත් විශාල වශයෙන් කැලෑ හෙළි කොට හේන් ගොවිතැන් කිරීමත් නිසා අලින්ගේ වාසභූමි නැති වී ඇත. ඔවුන් ජලය හා ආහාර සොයා යන සුපුරුදු සීමාව නොමැති වීම නිසා ඔවුන් කරදර වලට මුහුණ දෙයි. අලියා නුවණැති සතෙකු නිසා ඔවුන් විදුලි වැටවල්ද බිඳ දමයි.

අලි ඇතුන් සමඟ සහජීවනයෙන්, අලින් හා මිනිසුන් ජීවත් වූ කාලයක් විය. ඔවුන් අලින්ගෙන් බේරීමට පැරණි ක්‍රම අත්හදා බැලූහ.

1. වැලක බැඳි සීනු

2. දිරාපත් බිදෙන ලී.

3. බෝතල් එල්ලූ වැට මේ අතර විය.

මෙම ක්‍රම මිනිසාටත් අලියාට හානි පමුණුවන්නේ නැත. පැරණි මිනිසුන් හිරු බසිනා හවස හා හිමිදිරි පාන්දර ගමන් බිමන් අඩු කළේද මේ අවබෝධය

නිසයි. ඔවුන් අලින්ගේ ශබ්ද, කන් ගැසීම, අතුරිකිලි කැඩීම ආදියේදි නැවත හැරී ගමන නැවැත්වීය.

අද කාලයේ තත්වය මීට වෙනස් වේ. අලින් එළවීමට බෝම්බ, ගිනිකෙලි ආදිය පාවිච්චි කර ඇත. එවිට අලියාට තුවාල සිදුවේ. මේ නිසා අලින්ද මිනිසුන් හා වෛර බැදගෙන ඇත. මිනිසුන් ද අලින් කරදර පමුණුවන බවට සිතා ඔවුන් ගැන බිය වී සිටියි. මේ නිසා අලි මිනිස් ගැටුම දරුණු වී ඇත.

විදුලි වැට ඇදීම හේන් වටා ද කල යුතුයි. එමෙන්ම නිවස වටා ද එසේ කිරිමට වන්නේ ගෙය තුල ඇති ධාන්‍ය කෑමට අලියා එන නිසාය.

විදුලි වැට අසල අතුරිකිලි කපා සුද්ද කිරිම. අස්වැන්න කැපු පසු ගලවා නැවත පාවිච්චියට අරන් තැබීමද කල හැකිය.

අලි ඇතුන් ශ්‍රී ලංකාවේ ජාතික උරුමයේ වැදගත් කොටසකි. අනාගත පරම්පරාවට දායාද කොට භාර දිය හැකි සත්ව විශේෂයකි. අලි ඇතුන් රටේ සංවර්ධනයට බොහෝ සේ උපකාරි වේ. ශක්තිය ඇති සතෙකු ලෙස බර ඉසිලිමට බර ඇදීමට මෙන්ම රාජකීය මංගල සංකේතයක් ලෙසද අපේ

මුතුන් මිත්තන් අලියා භාවිතා කර ඇත. අදටත් ශ්‍රී ලංකාවේ අලියා වන්දනීය සතෙකි. ඒ බෞද්ධ සංස්කෘතියට කල සේවය නිසාය. පෙරහැර ඉන් ප්‍රධාන තැනක් ගනී. කන්ද උඩරට ඇසල පෙරහැර ඉන් එකකි. දළදා කරඬුව වැඩම වන හස්තීන් මෙයින් ප්‍රධාන තැනක් ගනී. මේ පෙරහැර බැලීමට විදෙස් සංචාරකයන් විශාල පිරිසක් පැමිණේ. මේ නිසා අලියා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අත්‍යවශ්‍ය අංගයකි.

අපේ සංචාරක කර්මාන්තය දෙස බලන කල ජාතික වනෝද්‍යාන ඉතා ජනප්‍රිය වේ. විදේශිය සංචාරකයින් මේ දෙසට ඇදී යන්නේ අලි ඇතුන් නැරඹීම සදහාය ශ්‍රී ලංකාවේ වනෝද්‍යාන අලි ඇතුන් පිළිබඳ ප්‍රසිද්ධයි.

මේ තුලින් විශාල විදේශ විනිමයක් ලැබේ. ලංකාවේ මෙන් අලි විශාල රංචු ලෙස විවෘත භූමියක දැක ගැනීමට අනික් ආසියානු රටවල බැරිවේ. අලියා ශ්‍රී ලංකාව හැදින්වීමේ ලංජනයක් බවට පත් වී ඇත.

එමෙන්ම අලියා අගය කල යුතු සතෙකු බවටහෙලි වී ඇත. ඔවුන්ට හානි නොකලොත් ඔවුන් වද වී යාමේ තර්ජනයෙන් බේරාගත හැකිය. අනික්

සතුන් අතර විශේෂ වන මෙම සතා ගෞරවාන්විත හා හොඳ සැලකිම් බලාපොරොත්තු වන සතෙකි.



# මුතුලි නතාරා දසනායක

කතෘ

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දූරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලූ ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

978624208940-9